1/11/71

# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 14,922/4 — 1970 සැප්තැම්බර් 7 වැනි සඳුද — 1970.9.7

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

## අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත් කිරීම් ආදිය

1970 අංක 281/3

අ. ආ. කා. අංකය : සී. 162/49 (8)

අග්‍රාණ්ඩුකාරතුමන් විසින් 1946 යේ හා 1947 තේ ලංකා (ආණ්ඩු ක්‍රම හා ස්වාධීනතා) රාජාඥවල 51 වැනි වගන්තිය යටතේ අධ්‍යාපන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්, පී. පී. උඩගම මහතා තම රාජකාරිවලට අමතරව නැවත නියෝග කරන තුරු 1970 සැප්තැම්බර් 4 වැනි දින සිට පාර්ලිමේන්තු කටයුතු හා ක්‍රීඩා අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වශයෙන් වැඩ බැලීමට පත් කළ බව මෙයින් දනුම් දෙනු ලැබේ.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,
ඩී. ජී. දයාරත්න,
අග්‍රාණ්ඩුකාරතුමාගේ ලේකම්.

අග්‍රාණ්ඩුකාරතුමාගේ කාර්යාලයේ දී,
කොළඹ, 1970 සැප්තැම්බර් 7.

9–576

---

## ශ්‍රී ලංකා මහ බැංකුවේ දන්වීම

### ශ්‍රී ලංකා මහ බැංකුව

1970 අගෝස්තු මස 29 වැනි දිනට ශේෂ පත්‍රය

**වගකීම්**

| | රු. | රු. |
|---|---|---|
| ප්‍රාග්ධන ගිණුම් | | |
| ප්‍රාග්ධනය — ... | 1,50,00,000 | |
| අතිරික්තය — ... | 5,60,00,000 | |
| | | 7,10,00,000 |
| වගකීම් | | |
| සංසරණයෙහි පවත්නා නෝට්ටු ... | 120,17,99,898 | |
| සංසරණයෙහි පවත්නා කාසි ... | 7,21,47,503 | |
| | | 127,39,47,401 |
| තැන්පතු | | |
| රජය ... ... | 1,59,05,629 | |
| රාජ්‍ය නියෝජ්‍යත්ව හා සංස්ථා ... | 24,72,452 | |
| වෙළෙඳ බැංකු ... ... | 13,40,35,094 | |
| ජාත්‍යන්තර සංවිධාන, විදේශීය රාජ්‍ය හා විදේශීය බැංකු ආයතන ... | 59,91,65,764 | |
| අනෙකුත් ... ... | 1,19,52,357 | |
| | | 76,35,31,296 |
| විදේශීය ණය ගැනීම් ... ... | | 37,99,11,613 |
| අනෙකුත් වගකීම් හා ගිණුම් — — | | 92,39,96,001 |
| | | 341,23,86,311 |

**වත්කම්**

| | රු. | රු. |
|---|---|---|
| ජාත්‍යන්තර සංචිතය | | |
| පිටරට තිබෙන මුදල් හා බැංකු ශේෂයන් (භාණ්ඩාගාර බිල්පත් ඇතුළුව) ... | 9,04,95,340 | |
| * විදේශීය රාජ්‍ය ණයපත් ... | 10,27,94,357 | |
| විශේෂ ආපසු ගැනීම් හිමිකම්පත් ... | 2,16,309 | |
| | | 19,35,06,006 |
| දේශීය වත්කම් | | |
| ණය සහ අත්තිකාරම් : | | |
| † රජයට .. ... | 35,21,05,163 | |
| අනෙකුත් අයට ... | 26,51,00,000 | |
| රජයේ හා රජය සහතික කළ ණයපත් | 182,14,03,307 | |
| | | 243,86,98,470 |
| අනෙකුත් වත්කම් හා ගිණුම් ... ... | | 78,01,81,835 |
| | | 341,23,86,311 |

* 1964 පෙබරවාරි මස 1 වැනි දින රු. 2,22,65,915 ක ප්‍රකාශිත වටිනාකමට හා 1965 මැයි මස 24 වැනි දින රු. 1,05,59,191 ක වටිනාකමට රජයේ ආයතන වලින් ලබාගත් ණයපත් ඇතුළත් වේ. (ඒ දිනවල මෙකී ණයපත්වල ඇස්තමේන්තු කළ වෙළෙඳ වටිනාකම පිළිවෙළින්, රු. 1,61,17,365 ක් සහ රු. 85,76,453 ක් විය.) මෙකී ණය පත් අතුරින් දකුණු රොඩේසියා ආණ්ඩුව විසින් රු. 1,42,857 ක ප්‍රකාශිත වටිනාකමට නිකුත් කරණ ලද ණය පත් 1969 මාර්තු මස 15 වෙනි දිනට මේරීමට නියමව තිබූ නමුදු, ඒවා මෙතෙක් මේරා ගෙන නැත.

† ජාත්‍යන්තර මූල්‍ය සංවිධානයන්ට ලංකාවේ දායක මුදල් වශයෙන් ගෙවීම සඳහා වූ රු. 9,19,95,163 ක විශේෂ ණය ද ඇතුළත් වෙයි.

ඩබ්ලිව්. තෙන්නකෝන්,
අධිපති.

ජේ. ගුණරත්නම්,
ප්‍රධාන ගණකාධිකාරි

**ඉහත සඳහන් ශේෂ පත්‍රය මගේ විධානය යටතේ පරීක්ෂා කරන ලදී. ශ්‍රී ලංකා මහ බැංකුවේ පොත් හා වාර්තා සහ මා වෙත සපයා ඇති තොරතුරු හා විස්තර අනුව, 1970 අගෝස්තු මස 29 වැනි දිනට, මහ බැංකුවේ කටයුතු පිළිබඳ පැවැති තත්ත්වය සාධාරණව හා සත්‍යව පිළිබිඹු වන පරිදි ශේෂ පත්‍රය නිසි ලෙස සකස් කොට ඇති බව මගේ අදහස වෙයි**

**ඩී. ආර්. සෙනෙවිනායක,**
**ඔඩිටර් ජනරාල්**

**1970 සැප්තැම්බර් මස 7 වැනි දින,**
**කොළඹ දීය.**

9 570

---

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## අංක 22/70 දරණ ආනයන පාලන දැන්වීම

**1970 එක්සත් රාජධානී/ලංකා ණය යටතේ වෙන්කළ කොටස් මත ආනයනය කිරීම**

(මෙම දැන්වීමෙන් යථෝක්ත ණය ගිවිසුම යටතේ බඩු ආනයනය කිරීම සඳහා ඉල්ලුම් පත් කැඳවීමක් නොකෙරේ)

යථෝක්ත ණය ගිවිසුම යටතේ එක්සත් රාජධානියෙන් ආනයනය කැරෙන බඩු සඳහා බලපත්‍ර නිකුත් කිරීමට අදහස් කර තිබේ.

2. යථෝක්ත ණය ගිවිසුම යටතේ ආනයන සඳහා වෙන් කළ කොටස් අනුව ආනයන බලපත් නිකුත් කිරීමේ කාර්ය පරිපාටිය පහත දක්වා ඇති අතර එය දැනට ක්‍රියාත්මකව පවත්නා කාර්ය පරිපාටිවලට අනුපූරකයක් වේ.

(i) " 1970 එක්සත් රාජධානී/ලංකා ණය " යන ශීර්ෂය යටතේ ආනයන සඳහා වෙන් කළ කොටසක් ලබන ආනයනකයා එක්සත් රාජධානියේ සැපයුම්කරු සමග ගනුදෙනු අරඹා ඔහු විසින් විධිමත් ලෙස සහතික කැරුණු නාමමාත්‍ර ඉන්වොයිසියේ ගිවිසුමේ පිටපත් 4 ක් ඔහුගෙන් ලබා ගනු ඇත. ගිවිසුම වූ කලී යම් විශේෂ වෙන් කිරීමකින් ආවරණය වන්නාවූ සැපයුම් සම්බන්ධයෙන් සකස් වූවක් බැව් හඳුනා ගැනීම පිණිස වෙන් කිරීම පවරමින් එවූ ලිපියෙහි යොමු අංකය සහ දිනය සහතික කළ නාමමාත්‍ර ඉන්වොයිසියෙහි/ගිවිසුමෙහි සඳහන් කළ යුතුයි. බඩුවල සම්භවය එක්සත් රාජධානියේ බවට සහ/හෝ ඒවායෙහි අන්තර්ගත බ්‍රිතාන්‍ය මූල ද්‍රව්‍ය ප්‍රමාණය නිශ්චය කරමින් සැපයුම් කරු දුන් සහතිකයක් ද නාමමාත්‍ර ඉන්වොයිසියෙහි/ගිවිසුමෙහි අඩංගු විය යුතුයි. එවැනි නාමමාත්‍ර ඉන්වොයිසියක/ගිවිසුමක සහතික පිටපත් තුනක්, වෙන් කිරීම් නිකුත් කිරීමේ බලධාරියා එනම්, ප්‍රස්ථාවයේ හැටියට ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව කර්මාන්ත හා විද්‍යා පර්යේෂණ කටයුතු අමාත්‍යාංශයේ රෙගුලාසි අංශය/සංස්ථා අංශය වෙත ඉදිරිපත් කළ යුතුයි. ඉන් අනතුරුව, " 1970 එක්සත් රාජධානී/ලංකා ණය " යන ශීර්ෂය සහිත බලපත්‍රයක් නිකුත් කිරීමට ආනයන පාලන දෙපාර්තමේන්තුව විසින් හෝ කර්මාන්ත හා විද්‍යා පර්යේෂණ කටයුතු අමාත්‍යාංශයේ රෙගුලාසි අංශය/සංස්ථා අංශය විසින් හෝ ක්‍රියා කරනු ලැබේ.

(ii) එවැනි බලපත්‍රයක් නිකුත් කළ විට, ලංකාවේ වාණිජ බැංකුවක් සමග ණයවර ලිපියක් ආරම්භ කිරීමට ආනයනකයා පියවර ගනු ඇත. වාණිජ බැංකුව විසින් එක්සත් රාජධානියේ පිහිටි සිය නියෝජිත බැංකුව මගින් එක්සත් රාජධානියේ සැපයුම්කරුට මුදල් ගෙවීමටත් ශ්‍රී ලංකා මහ බැංකුවට අවශ්‍ය ලේඛනගත කිරීමටත් විධිවිධාන සලසනු ලැබේ.

(iii) " 1970 එක්සත් රාජධානී/ලංකා ණය " යටතේ නිකුත් කැරුණු බලපත්‍රයන්හි බලය පිට ආනයනය කළ සියලුම බඩු එක්සත් රාජධානියෙහි, චැනල් දූපත්හි නැතහොත් අයිල් ඔෆ් මෑන්හි සහමුලින්ම නිෂ්පාදිත හෝ නිර්මවිත හෝ ඒවා විය යුතුයි. පසු යම් ලේඛන ගත කිරීමකට අමතරව බලපත්‍රයෙන් ආවරණය වන බඩු සහ සේවා සම්බන්ධයෙන් ' අ ' පරිශිෂ්ටයෙහි දක්වෙන ආකෘතියෙහි ද රසායන ද්‍රව්‍ය සහ ඊ හා සම්බන්ධ නිෂ්පාදන සම්බන්ධයෙන් ' ආ ' පරිශිෂ්ටයෙහි දක්වෙන ආකෘතියෙහි ද ගෙවුම් නිවේදනයක් සැපයිය යුතුයයි සැපයුම්කරුවනට නියම කළ යුතුයි.

පහත සඳහන් කරුණු සැලකිල්ලට ගත යුතුයි.

(i) " 1970 එ. රා./ලංකා ණය " බලපත්‍රයකින් ආවරණය වන සියලුම ආනයනයන් ණයවර ලිපිය අනුව විය යුතුයි.

(ii) " 1970 එ. රා./ලංකා ණය " යන ශීර්ෂය සහිතව නිකුත් කැරුණු බලපත් යටතේ මුදල් යොදවන ලද සැපයුම් සහ සේවා සඳහා එක්සත් රාජධානියේ, චැනල් දූපත්හි නැතහොත් අයිල් ඔෆ් මෑන්හි ව්‍යාපාර කටයුතුවල නිරතව සිටින පුද්ගලයින්ට මුදල් ගෙවිය යුත්තේ ස්ටර්ලින් වලින් පමණි.

(iii) ගනුදෙනුව භී. ර. ග. පදනමක් මත පිහිටා ඇති කල්හි, සම්පූර්ණ මුදල ණය යටතට ගැනේ. නැ. වි. ස. ගිවිසුම් ඇති විට, නැව්ගත කිරීමේ කටයුතු බ්‍රිතාන්‍ය වෙළඳ සමාගමක් සමග පිළියෙළ කළයුතු අතර රක්ෂණය ද ලංකා රක්ෂණ සංස්ථාවට පවරා නැතිනම් බ්‍රිතාන්‍ය සමාගමක් සමග පිළියෙල කරගත යුතුයි.

ආන්. ඩබ්. එච්. ඩී. ගුණරත්න,
වැඩ බලන ආනයන හා අපනයන පාලක.

1970 සැප්තැම්බර් 6 දින,
කොළඹ දී ය.

**"අ" පරිශිෂ්ටය**

### 1970 එක්සත් රාජධානී/ලංකා ණය

**ගෙවුම් නිවේදනයයි**

(i) මෙම ගෙවීම් සහතිකය සමග ඇති පහත දක්වෙන ඉන්වොයිසිවල හෝ ඒවායේ පිටපත්වල හෝ සඳහන් මුදල් ලැබී ඇති බැව් ද

| ගිවිසුම්කරුගේ ඉන්වොයිසි අංකය | දිනය | මුදල | ගෙවීමේ දිනය | බඩු, වැඩ සහ/හෝ සේවා පිළිබඳ කෙටි විස්තරයක් |
|---|---|---|---|---|

(ii) මිලට ගන්නා ලද්දේ පිටරටකින් හෝ වේවා එක්සත් රාජධානිය තුලින් හෝ වේවා සම්භවය එක්සත් රාජධානියෙහි නොවන බඩු හෝ ද්‍රව්‍යයන් හෝ සම්බන්ධයෙන් ගිවිසුම්කරු විසින් ගෙවන ලද හෝ ගෙවිය යුතුව ඇති හෝ පහත සඳහන් මුදල පූර්වෝක්ත ඉන්වොයිසිවල අන්තර්ගතව ඇති බැව්ද

(නැ. වි. ස. වටිනාකම)..................
විෂයයන් පිළිබඳ විස්තර.

(iii) (ii) වන ඡේදයෙන් නියමිත මුදල හැර (i) වන ඡේදයෙන් නියමිත සියලුම මුදල් ප්‍රමාණයන් එක්සත් රාජධානියෙහි සම්භවය ඇති බඩු සහ සේවා සඳහා ගෙවිය යුතු බැව්ද

(iv) පහත නම සඳහන් ගිවිසුම්කරු වෙනුවෙන් මෙම සහතිකයෙහි අත්සන් තැබීමට මට බලය ඇති බැව්ද මෙයින් සහතික කරමි.

**අත්සන :————.**

**උසුලන තත්ත්වය :————.**

**කවුරුන් සඳහා ද වෙනුවෙන් ද යනවග :————.**

**ගිවිසුම්කරුගේ නම සහ ලිපිනය :————.**

**දිනය :————.**

මෙම ප්‍රකාශයේ අභිමතාර්ථය උදෙසා එක්සත් රාජධානියට චැනල් දූපත් සහ අයිල් ඔෆ් මෑන්, ඇතුළත් වේ.

"ආ" පරිශිෂ්ටය (රසායන ද්‍රව්‍ය)

## 1970 එක්සත් රාජධානි/ලංකා ණය

### රසායන ද්‍රව්‍ය සහ ඒ හා සම්බන්ධ නිෂ්පාදන සඳහා පමණක් ගෙවුම් නිවේදනය

1. ඉන්වොයිසියේ දිනය :———— ඉන්වොයිසි අංකය :————.

2.

| ගැනුම්කරුට සැපයූ නිෂ්පාදනයේ (වල) විස්තර (අ සටහන) | පවුම් මිල | එ. රා. ගාස්තු වක්‍ර වර්ගී කරණ අංකය (ආ සටහන) | නිෂ්පාදනයෙහි සම්භාවය එ. රා. යෙහිද ? (ඇ දන්වීම බලන්න) "ඔව්", "නැත" යන්න සඳහන් කරන්න |
|---|---|---|---|
| ———— | ———— | ———— | ———— |
| ———— | ———— | ———— | ———— |
| ———— | ———— | ———— | ———— |
| ———— | ———— | ———— | ———— |

3. ගැනුම්කරු ගෙවූ මුළු මුදල ස්ටර්ලින් වලින්—පවුම්     ගෙවීමේ දිනය

4. (අ) පූර්වෝක්ත ඉන්වොයිසියෙහි—එහි පිටපතක් මෙම ගෙවුම් නිවේදනය සමඟ ඇත–සඳහන් මුදල ලැබී ඇති බැව්ද

(ආ) පහත නම සඳහන් ගිවිසුම්කරු වෙනුවෙන් මෙම සහතිකයෙහි අත්සන් තැබීමට මට බලය ඇති බැව්ද මෙයින් සහතික කරමි.

අත්සන :————.

උසුලන තනතුර :————.

කවුරුන් සඳහාද වෙනුවෙන්ද යන වග :————.

ගිවිසුම්කරුගේ නම සහ ලිපිනය :————.

දිනය :————.

#### සටහන්

අ මෙම ආකෘතිය පාවිච්චි කළ යුත්තේ රසායන ද්‍රව්‍ය සහ ඒ හා සම්බන්ධ නිෂ්පාදන සඳහා පමණි. ඉන් වැඩි කොටසක් 15, 25, 28–35 යන අධිකාරවල උප ශීර්ෂවලින් ද එ. රා. ගාස්තු වක්‍රයේ 37–40 යන අධිකාරවලින් ද ආවරණය වේ.

ආ පහත සඳහන් දෑ බලන්න.

(i) එච්. එම්. රේගුව සහ සුරාබද්ද ගාස්තු වක්‍රය. එම්. එම්. එස්. ඕ.

(ii) බ්‍රසල් ගේ නාමාවලියෙහි එන රසායන ද්‍රව්‍ය වර්ගී කරණ. එච්. එම්. එස්. ඕ.

ඇ (i) කිසියම් නිෂ්පාදනයක් සම්පූර්ණයෙන්ම එක්සත් රාජධානියේ දේශීය ද්‍රව්‍ය යොද තනා ඇත්නම් හෝ නැතහොත් සම්පූර්ණයෙන්ම හෝ කොටස් වශයෙන් හෝ ආනයන ද්‍රව්‍ය යොද අදළ යු. නි. වෙ. ගි. (ඊඑෆ්ටීඒ) යෝග්‍යතා කාර්යාවලිය අනුව තනා ඇත්නම් එම නිප්පාදනය 'එ. රා. සම්භවය ' සහිතයයි සැලකේ.

(ii) යු. නි. වෙ. ගි. (ඊඑෆ්ටීඒ) යෝග්‍යතා කාර්යාවලි අපනයනකයන්ගේ එච්. එම්. එස්. ඕ. හි ප්‍රයෝජනය සඳහා වූ යු. නි. වෙ.ගි (ඊඑෆ්ටීඒ) සංග්‍රහයේ 1 වන උප ලේඛනයෙහි සඳහන්ව ඇත.

(iii) මෙම ප්‍රකාශයේ අභිමතාර්තයෙන් සඳහා " විකල්ප ප්‍රතිශත මිනුම් දණ්ඩ " බල නොපාන බැව් අවධාරනයෙන් සඳහන් කළ යුතුයි.

(iv) යථෝක්ත උපලේඛනයෙහි එන " සම්භව ප්‍රදේශය " යන පදයන්ගී අර්ථය වශයෙන් සැලකිය යුත්තේ " එ. රා සම්භාවය " යන්න පමණයි.

(v) මෙම ප්‍රකාශයේ අභිමතාර්ථයන් සඳහා " මූලික ද්‍රව්‍ය ලැයිස්තුව " (යු. නි. වෙ. ගි. සංග්‍රහයේ 3 උපලේඛණය) බල පාන්නේ නැත.

(vi) ප්‍රශ්නයට භාජනව ඇති ද්‍රව්‍ය සඳහා යෝග්‍යතා කාර්යාවලියක් ලැයිස්තු ගත කර නැති නම් ලන්ඩන් එස්. ඩබ්ලිව්. 1, ස්ටැග් ප්ලේස් හි ඉලන්ඩහවුස් හි විදේශ සංවර්ධන අමාත්‍යාංශයේ මුදල් අංශයේ නය පරිපාලන අංශයෙන් උපදෙස් ලබා ගත යුතුයි.

මෙම ප්‍රකාශයේ අභිමතාර්ථය උදෙසා එක්සත් රාජධානියට වැනල් ද්‍රපත් සහ අයිල් ඔෆ් මෑන් ඇතුලත් වේ.

9—571

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයාධිපතිගේ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.